**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2022**

**--------------------------------------------------------------**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 ජුලි 17 දින වනවිටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පැවති ගැටලුකාරී තත්ත්වයෙන් පසු 2024 වර්ෂයේ මුල් කාර්තුව අවසාන වන විට ප්‍රමාද මූල්‍ය වාර්තා ඉදිරිපත් කර අවසන් කළ හැකි වන අතර එයින් පසුව දෛනික ගනුදෙනු යාවත්කාලීන ව පවත්වාගෙන යා හැකි යැයි අපේක්ෂිත බව. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 102 සිට 110 දක්වා විධිවිධාන | ජාතික පුස්තකාල ප්‍රලේඛන සංචිතය තුළ ස්ථාපිතව තිබුණු මාර්ටින් වික්‍රමසිංහ එකතුවට අයත් පොත් 35 ක් අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකතු ප්‍රතිසංවිධාන කටයුතුවල දී ද මෙම අස්ථානගත පොත් 35 සොයා ගැනීමට නොහැකි වුවහොත් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර ව කටයුතු කිරීම සිදු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 756 හා 757 | 2022 දෙසැම්බර් 31 දිනට මිලදීගෙන තිබුණු පිරිවැය රු.115,032,640 ක් වූ පොත් තොගය හා ජාතික පුස්තකාලයේ සංරක්ෂිත ප්‍රලේඛන සම්පත් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණි. | ජාතික පුස්තකාලයේ සංරක්ෂිත ප්‍රලේඛන සම්පත් 2023වර්ෂයේ සිට අදියර වශයෙන් සමීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර සැලැස්මක් සකස් කර ඇති අතර, ඒ අනුව සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant /20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමෙන් තොරව 2020 වර්ෂයේ සිට 2023 ජුලි 15 දක්වා ව්‍යාපෘති 03 කට අදාලව එකතුව රු.43,596,398 ක් වූ විදේශ ප්‍රදාන මණ්ඩලය විසින් සෘජුවම ලබාගෙන තිබුණි. එසේම භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රාජකාරි කාලය තුළ මණ්ඩලයේ ස්ථිර කාර්යමණ්ඩලය ව්‍යාපෘති කාර්යයන් සඳහා යොදවා සමාලෝචිත වර්ෂය සඳහා හා 2023 ජනවාරි 01 දින සිට 2023 ජූලි 15 දක්වා පිළිවෙළින් රු.2,513,960 ක් හා රු.19,471,740 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් අනුව Skills Online Sri Lanka ව්‍යාපෘතිය හා මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පිළිවෙලින් 2021 හා 2022 වර්ෂවල විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කල ද ඒ සඳහා කිසිදු පිළිතුරක් ලැබී නොමැත. අස්පර්ශනීය සංස්කෘතික උරුමය සංරක්ෂණය යන රූපවාහිනි වාර්තාමය වැඩසටහනේ වීඩියෝ සකස්කිරීමේ ව්‍යාපෘතියට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව අදාළ ගෙවීම් සිදු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.383,231,029 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2021, 2022 යන වර්ෂවල සිදු කරන ලද ස්ථාවර වත්කම් මිල දී ගැනීම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති බව. | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා පනත | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 12(2)(අ) ,(ආ) වගන්ති | (i) පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයට ඇතුලත් අයිතම 2015 වර්ෂයේදී නව පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතියකට අයිතම ඇතුලත් කිරීමේදී 330,228ක් ඇතුලත් වී නොතිබුණු අතර ඇතුලත් වූ අයිතම වලද සමහර දත්ත සාවද්‍ය වූයෙන් පාඨකයින්ට මෙම සම්පත් පරිශීලනය කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. 2015 වර්ෂය දක්වා ප්‍රලේඛන සම්පත් අයිතම දසලක්ෂයක් පවතින බව අනුමාන කර පරිග්‍රහණ අංක වෙන්කළද ඉදිරිපත්කළ දත්ත අනුව අයිතම 503,532 ක් විය. එම අනුමාන කිරීම හේතුවෙන් පරිග්‍රහණ ලේඛනයේ අංක 496,468ක් අතිරික්තව පැවතීම අනාවරණය කර නොතිබුණි. | කාර්යමණ්ඩල හිඟතාවය හේතුවෙන් මෙම කාර්යය නොකඩවා කරගෙනයාමේ ගැටලු පවතී. 2016 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද KOHA පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය දසලක්ෂයෙන් ආරම්භ කිරීමට කටයුතු කර ඇති බව. | පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතය විධිමත්ව ස්ථාපිත කර ක්‍රමවත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යා යුතුය. |
| | | (ii) පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතයක් ලබාදීම, දේශීය හා විදේශීය ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම, වැඩිදියුණු කිරීම, පවත්වාගෙනයාම හා සංරක්ෂණය සම්බන්ධයෙන් මණ්ඩලයට පැවරී තිබෙන කාර්යයන් ඉටු කරනු ලබන සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන, ප්‍රතිග්‍රහන සහ ග්‍රන්ථ විඥාපන හා පාලන අංශවල ඉටුකළ යුතු ලෙස හඳුනාගන්නා ලද පිළිවෙලින් ඒකක 29,579ක්, 9,210ක් හා 4,743ක් අත රැඳී තිබුණි. | කාර්යමණ්ඩල හිඟකම ඉහත එකතුව සංරක්ෂණය කල්ගත වීමට හේතුවක් වී ඇති බව. | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරී ඇති කාර්යයභාරය කාර්යක්ෂමව ඉටුකළ යුතුය. |
| (ii) | 12(2) (උ) වගන්තිය | ග්‍රන්ථ නාමවලි ප්‍රකාශයට පත් කළ යුතු කාලවකවානුව නියම කර නොතිබුණු අතර 2023ජූලි 14 දින වනවිට 2022ඔක්තෝම්බර් මාසයෙන් පසුව ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශයට පත් කර නොතිබුණි. | 2023 වර්ෂය තුළ පළ කිරීමට බලාපොරොත්තුවන ග්‍රන්ථ නාමාවලි කලාප පිළිබඳ තොරතුරු වාර්ෂික සැලැස්මේ පළ කර ඇත. ඒ අනුව 2023 දෙසැම්බර් මාසය වන විට 2023 අගෝස්තු කලාපය තෙක් | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරී ඇති කාර්යයභාරය කාර්යක්ෂමව ඉටුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | සම්පාදනය කිරීමට සැලසුම් කර ඇති බව. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 හා 2022 වර්ෂවලදී භාවිතයට නොගන්නා මුද්‍රණ යන්ත්‍රයක් සේවා කිරීම සඳහා රු.49,680 ක් ගෙවා තිබුණද සේවා කිරීමක් සිදුකර නොතිබුණි. | මෙම යන්ත්‍රය සේවා කිරීම සිදු කර නොමැති නිසා සේවා ගිවිසුමට ගෙවන ලද මුදල අදාළ සේවා කිරීම් සිදු කරනු ලබන ආයතනය වෙතින් අය කර ගැනීමට කටයුතු කරගෙන යමින් පවතින බව . | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ප්‍රලේඛන සම්පත් සංචිතය පිහිටි ගොඩනැගිල්ලේ කොටසක් කුලී පදනම මත බාහිර ආයතනයකට ලබාදීමට එළඹි අවබෝධතා ගිවිසුමේ 21 වගන්තිය අනුව ජාතික පුස්තකාල ප්‍රලේඛන සංචිතයේ මිල කළ නොහැකි හා ඉතා දුර්ලභ පුස්කොළ පොත් / පැරණි / නව ප්‍රලේඛන සම්පත් ඇති බැවින් හදිසි ගින්නක් ඇති වුවහොත් එය මැඩපැවැත්වීමට හැකි යාන්ත්‍රණයක් සැකසීම හා මණ්ඩලයේ දේපළ හා සේවකයින් රක්ෂණය කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදාළ රක්ෂණ කටයුතු ගිවිසුම් අත්සන් කිරීමත් සමඟ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවරයන් ගෙන ඇති බව. | ප්‍රලේඛන සම්පත් සංචිතයේ ආරක්ෂාව වගකීමෙන් යුතුව ඉටුකිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුකළ යුතුය. |
| (ඇ) මාර්ටින් වික්‍රමසිංහ එකතුව නැවතත් ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනයක් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව මණ්ඩලයේ සභාපතිවරයා කළ ඉල්ලීමකට අනුව 2022 අප්‍රේල් 08 දින රු.3,818,805 ක් වටිනා දැව භාණ්ඩ ඒකක 29ක් රාජ්‍ය දැව සංස්ථාවෙන් ඇණවුම් කර තිබුණි. 2022 ඔක්තෝබර් 25 දින ඒ සඳහා රු.ලක්ෂ 02 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර එම භාණ්ඩ 2023 ජනවාරි මාසයේදී මණ්ඩලයට ලැබී තිබුණි . | 2022 වර්ෂයේ දී මේ සඳහා මණ්ඩලයේ ප්‍රතිපාදන වෙන් වී නොමැත. නමුත් රාජ්‍ය ආයතනයක් බැවින් ප්‍රතිපාදන නොමැති තත්ත්වයක් තුළදී වුව ද රාජ්‍ය දැව සංස්ථාවෙන් මෙම ද්‍රව්‍ය ඉල්ලුම් කර 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන අනුමත වීමෙන් පසුව අදාළ නිමි භාණ්ඩ ගෙන්වා ගැනිමට කටයුතු සිදු කරන ලද බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම 2018 ජනවාරි 09 දින සිට මාස 24කින් නිම කිරීම සඳහා රු.211,937,795ක බදු රහිත කොන්ත්‍රාත් මුදලකට අධ්‍යාපන අමාත්‍යාංශය කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම් ගතවී තිබුණි. 2020 වර්ෂය වන විට සමාගම වෙත රු.252,463,612ක් ගෙවා තිබුණු අතර අවස්ථා 3කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගෙන තිබුණද 2021 මාර්තු මාසයේදී කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබුණි. අංක 15-02-07 දරන හා 2021 ජනවාරි 05 දිනැති සභාපතිගේ ලිපියෙන් ප්‍රධාන කරුණු 18 ක් හා බිම් මහලේ සිට සිව්වන මහල දක්වා අසම්පූර්ණ හා නියමිත පරිදි නිම නොකළ කොන්ත්‍රාත් කාර්යයන් හඳුනාගෙන තිබුණු නමුත්, 2023 ජූලි 17 දින වනවිටත් එම අඩුපාඩු සම්පූර්ණකර නොතිබුණි. | මුදල් ප්‍රතිපාදනයන් නොමැති වීම හේතුවෙන් නවීකරණ කටයුතු 2021 වසරේ අතරමඟ නවතා දමන ලද ලදී. මේ වන විට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඉදිරිපත් කර ඇත. ඉතිරි කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී තිබුණු නමුත් මේ වන විට එම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත බැවින් වෙළෙඳපොළේ මිල ගණන් කැඳවීමක් හරහා සුදුසු පාර්ශවකරුවෙකු තෝරා ගන්නා ලෙස නිර්දේශ වී ඇති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නවීකරණ කටයුතු කඩිනමින් අවසන්කර ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ අංශවලට අයත් උප පද්ධතිද ඇතුළත් ප්‍රධාන පරිගණක මෘදුකාංග පද්ධති 10 ක පරිශීලක නාම (user name) හා මුරපද (password) 2020 පෙබරවාරි 13 දින සේප්පුවේ තැන්පත් කර තිබුණු නමුත් එදිනෙන් පසු මාස 39 ක් ගත වී තිබුණද පරිශීලක නාම (user name) හා මුරපද (password) යාවත්කාලීන වන පරිදි සේප්පුවේ තැන්පත් කර නොතිබුණි . | තොරතුරු තාක්ෂණ අංශයේ සේප්පුව තුළ මණ්ඩලයේ පරිගණක තොරතුරු පද්ධතිවල පරිශීලක නාම හා මුරපද යාවත්කාලීන කර තැබීමටත්, එහි ද්විත්ව යතුරු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ යන නිලධාරීන් විසින් භාවිතා කිරීමටත් කටයුතු කිරීමට නියමිත බව. | එක් නිලධාරියෙකු භාරයේ මණ්ඩලයේ පරිශීලක නාම (user name) හා මුරපද (password) පැවතීමේ අවධානම අවම වන පරිදි යාවත්කාලීනව සේප්පුවක තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික පුස්තකාල ප්‍රලේඛන සම්පත් සංචිතයේ සංරක්ෂණය සඳහා ආර්ද්‍රතාවය මනාව පවත්වා ගැනීමට ස්ථාපිත වායුසමීකරණ පද්ධතිය පැය 24 පුරාම | විදුලි බිල ඉහළ යන බැවින් දැනට වායු සමීකරණ පද්ධතිය රාජකාරී කාලය තුළ දී පමණක් ක්‍රියාත්මක වේ. එම නිසා පැය 24 ම වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක | ප්‍රලේඛන සම්පත් සංචිතයේ සංරක්ෂණ කාර්යය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වා |

| | | | |
|---|---|---|---|
| | අඛණ්ඩවම පැවතිය යුතු වුවත් විදුලි ගාස්තු වැඩිවීම නිසා සතියේ දිනවල පැය 17 ක්ද සති අන්ත හා නිවාඩු දිනවලදී පැය 24 ක් ද වායුසමීකරණ පද්ධතිය ක්‍රියාවිරහිත කිරීම නිසා ප්‍රලේඛන සම්පත් සංචිතයේ සංරක්ෂණ කාර්යය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි. | කිරීමේ දී වැය වන විදුලි බිල ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගත යුතු බව. | දිය යුතුය. |
| (ඇ) | සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය යටතේ පැවති පිරිවැය රු.3,660,547 ක් වූ උපකරණ සහිත රසායනාගාරය ස්ථාපිතකර තිබුණු ස්ථානයෙන් ඉවත් කිරීම නිසා එහි කටයුතු 2018 වර්ෂයේ සිට 2023 ජුලි 18 දින දක්වාම නතර වී තිබුණි. අවුරුදු 05ක කාලයක් රසායනාගාරය තුළින් ඉටුකරන දිරාපත් වූ පොත් පිරිසැකසුම් (tissue) කටයුත්ත ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට අංශයේ සේවය කරන ලේඛන සංරක්ෂක විසින් අවශ්‍ය උපකරණ කිහිපයක් බැඳුම්හල වෙත ගෙනවිත් රසායන සංරක්ෂණ කටයුතුවල නිරත වෙයි. දැනට තාවකාලිකව පළමු මහලේ තබා තිබූ Temperature Humidity Control Unit සහ Leaf Casting Machine උපකරණ පොත් බැඳුම්හල වෙත ගෙන එන ලදි. මෙම උපකරණ නඩත්තු අංශය සේවා කිරීමට කටයුතු කරමින් පවතින බව. | පොත් සංරක්ෂණ කටයුතු සඳහා රසායනාගාරයක් අත්‍යාවශ්‍ය බැවින් රසායනාගාර කටයුතු ඉටුකෙරෙන පරිදි විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය. |
| (ඈ) | නිශ්චිතව සකස් කරන ලද ඉදිරි සැලැස්මක් අනුව ප්‍රලේඛන සම්පත් ක්ෂේත්‍රගත දෛනික පරීක්ෂාවේදී පරිග්‍රහණ අංක අනුව හඳුනාගන්නා ප්‍රලේඛන සම්පත් සඳහා යෙදිය යුතු ප්‍රතිකර්ම සැලැස්මක් (Treatment plan) පිළියෙල කර එම සැලැස්මට අනුව ප්‍රලේඛන සම්පත් සඳහා යොදනු ලැබූ සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන ප්‍රතිකර්ම (Diagnosis card) පිළිබඳ දත්ත පරිග්‍රහණ අංකය අනුව පරිගණක තොරතුරු ලේඛනයකට ඇතුළත් කර සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන ප්‍රතිකර්මවල ප්‍රමාණවත් බව තහවුරු කිරීමට කටයුතු කර නොතිබුණි. | සංරක්ෂණ ප්‍රතිකර්ම හා බැඳුම් කටයුතු ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බැවින් ප්‍රමුඛතාව මත තෝරාගත් එකතු පමණක් සංරක්ෂණය කරයි. නමුත් අදාළ දත්ත පරිගණක පද්ධතියකට ඇතුළත් කිරීම නොකරයි. මෙම කාරණය සංරක්ෂණ උපදේශන කමිටුව වෙත යොමු කර දත්ත පදනමක් ස්ථාපිත කිරීමට නියමිත බව. | ප්‍රලේඛන සම්පත් ප්‍රතිකර්ම සැලැස්මට (Treatment plan) අනුව ප්‍රලේඛන සම්පත් සඳහා යොදනු ලැබූ සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන ප්‍රතිකර්ම (Diagnosis card)) පිළිබඳ දත්ත පරිග්‍රහණ අංකය අනුව පරිගණක තොරතුරු ලේඛනයකට ඇතුළත් කර සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන ප්‍රතිකර්මවල ප්‍රගතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |